# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2416/09 - 2024 දෙසැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2024.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය අනුර කරුණාතිලක වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**අනුර කරුණාතිලක** (පා.ම),<br>
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 12 වැනි දින,<br>
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය,<br>
12 වන මහල,<br>
"සෙත්සිරිපාය" අදියර - II,<br>
බත්තරමුල්ල.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

### බිංගිරිය අපනයන සැලසුම් කලාපයට සමගාමී නගර සංවර්ධන බල ප්‍රදේශයේ කොටසක් නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම

*I තීරුව*

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දාව මුළු මහත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වන්නා වූ ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 1428- මාදුළුපිටිය, අංක 1429. කෝන්කඩවල, අංක 1430- හමන්නාපහුව, 1431- කුරුඳුපොත, අංක 1432- කැලැගෙදර, අංක 1433-තෝරබිච්චිය, අංක 1434 - තාරණ, අංක 1435 - උඩවෙල, අංක 1436 - පඩිවෙල, අංක 1437 -මෙළදෙණිය, අංක 1438- කුඩුකලව 1439- නිතලව, 1440- හෙන්ඩියපොළ, අංක 1441 - කරදනයාගම, අංක 1442-කෝසාගම, අංක 1452 පහළ ගල්වැව, 1453- ගල්වැව, 1454 - කොස්හේනාගාර, 1457- බ්‍රහ්මණයාගම, අංක 1458-ඌරාපොත්ත, අංක 1459. බිංගිරිය, අංක 1460-මුරුකණ්ඩිය, අංක 1461 - මුකලන්හේන, අංක 1462- මාළනාව, 1463 - බෝවත්ත, 1464- පානවැව, අංක 1465- පහළ කොස්වත්ත, අංක 1466- ඉහළ කොස්වත්ත, අංක 1467-වඳුරැස්ස, අංක 1468- වැල්ලරාව, අංක 1469- බක්මීරුප්ප, අංක 1473-හොරගස්අගාර, අංක 1474 -පහළ මණ්ඩකොන්ඩාන, අංක 1475- හිරුවල්පොල, අංක 1476- ඉහළ කළුගම. අංක 1477- කඳුරුවැව, අංක 1478 - විලත්තව, අංක 1479- අළුත්ගම, අංක 1480- ඉහළ කඩිගමුව, අංක 1481-හින්පන්නාව, අංක 1482- පහළ කඩිගමුව යන ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත වූ සහ කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 1167- කොස්දෙන, 1168- පහළ ගල්පොල, අංක 1169-ඉහළ ගල්පොල, අංක 1170 - දිගල්ල, අංක 1171 - දික්හැර, අංක 1172 - ඉලුක්වෙන, අංක 1173 - මාවෙල, අංක 1174- ඉහළ එලතලව, අංක 1175- පහළ එලතලව, අංක 1176- කටුවැල්ල, අංක 1181 - පල්ලෙවෙල, අංක 1185- පහළ වීරඹුව, අංක 1186- මඩකුඹුරුමුල්ල, අංක 1188- මාහිම්පිටිය. අංක 1189 - තලහිටිමුල්ල, අංක 1190- ඉහළ අංක 1194- හම්මලව, අංක 1196 - ගලගෙදර, අංක 1197- වෙරලුගම යන ග්‍රාම නිලධාරි කොට්ඨාස වලින් සමන්විත වූ II තීරුවේ විස්තර වන ඉම් සහ මායිම් වලින් යුක්ත වන්නා වූ මුළු මහත් භූමි ප්‍රදේශය.

*II තීරුව*

*උතුරට :*

බිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1452 පහළ ගල්වැව ග්‍රාම නිලධාරි වසමේ උතුරු හා බටහිර මායිම් ඡේදනය වන ලක්ෂ්‍යයෙන් ආරම්භ වී (දැදුරු ඔය මධ්‍ය රේඛාව ඔස්සේ) එම ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර ඊශාන ගිණිකොණ හා නැගෙනහිර දෙසට ගමන් කර අංක 1453 ඉහල ගල්වැව ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ඊශාන දෙසට ගමන් කර එම වසමේ උතුරු මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ නැගෙනහිර, ගිණිකොණ (බෝවත්ත ගැටුලාව මාර්ගය හමුවන තෙක්ද) ඊශාන ගිණිකොණ දෙසට ගමන් කර අංක 1454 කොස්හේනාගාර ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ නැගෙනහිර හා දකුණු දෙසට ගමන් කර අංක 1442 කෝසාගම ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම් ඔස්සේ ඊශාන දෙසට ගමන් කර එම වසමේ උතුරු මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ හා නැගෙනහිර දෙසට ගමන් කර එම වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද,

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 1442 කෝසාගම ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොණ, දකුණ හා බටහිර දෙසට ගමන් කර (කොළමුණු ඔය මධ්‍ය රේඛාව ඔස්සේ) අංක 1467 වඳුරැස්ස ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ දකුණු හා නැගෙනහිර දෙසට ගමන් කර අංක 1438 කුඩාකලව ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ඊශාන, නැගෙනහිර නැවතත් ඊශාන දෙසට ගමන් කර එම වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ගමන් කර එම වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ, බටහිර, දකුණ, බටහිර හා නැවතත් දකුණු දෙසට ගමන් කර (හලාවත කුරුණෑගල මාර්ගය ඡේදනය කරමින්) අංක 1429 කෝන්කඩවල ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ නැගෙනහිර හා ගිණිකොණ දෙසට ගමන් කර අංක 1430 හමන්නාපහුව ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ නැගෙනහිර, දකුණ, ගිණිකොණ, දකුණ, ගිණිකොණ, බටහිර හා නිරිත දෙසට ගමන් කර අංක 1431 කුරුඳුපොත ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ දකුණ, බටහිර, ගිණිකොණ දෙසට ගමන් කර අංක 1176 කොටුවැල්ල ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක්ද එතැන් සිට මායිම ඔස්සේ ඊශාන ගිණිකොණ හා දකුණ දෙසට ගමන් කර අංක 1175 පහළ එලතලව ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම් ඔස්සේ දකුණු දෙසට ගමන් කර අංක 1174 ඉහළ එලතලව ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර අංක 1170 දිගල්ල ග්‍රාම නිලධාරී වසමේ

උපලේඛනය I *(සම්බන්ධිතයි)*

*I තීරුව*

*II තීරුව*

නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ දකුණ, නැගෙනහිර නැවතත් දකුණු දෙසට ගමන් කර එම වසමේ දකුණු මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර දෙසට ගමන් කර අංක 1171 දික්හැර ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ, දකුණු හා නිරිත දෙසට ගමන් කර එම වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ වයඹ හා නිරිත දෙසට ගමන් කර අංක 1172 ඉලුක්හේන ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර හා දකුණු දෙසට ගමන් කර අංක 1181 පල්ලේවෙල ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ නැගෙනහිර හා දකුණ (මාදම්පේ - කුරුණෑගල මාර්ගය ඡේදනය කරමින්) දෙසට ගමන් කර අංක 1185 පහළ වීරඹුව ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ දෙසට ගමන් කර එම වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර 1186 මඩකුඹුරුමුල්ල ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ හා දකුණු දෙසට ගමන් කර අංක 1188 මාහිම්පිටිය ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ හා ඊශාන දෙසට ගමන් කර එම වසමේ නැගෙ නහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ නිරිත හා ගිණිකොණ දෙසට ගමන් කර අංක 1190 ඉහල කලුගමුව ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ නැගෙනහිර, ඊශාන, ගිණිකොණ හා නැවතත් නැගෙනහිර දෙසට ගමන් කර අංක 1194 හම්මලව ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ඊශාන දෙසට ගමන් කර එම වසමේ උතුර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ නැගෙනහිර, උතුරු හා නැවතත් නැගෙනහිර දෙසට ගමන් කර එම වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ නිරිත හා දකුණු දෙසට ගමන් කර අංක 1196 ගලගෙදර ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර එම වසමේ දකුණු මායිම හමුවන තෙක්ද,

*දකුණට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 1196 ගලගෙදර ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ බටහිර දෙසට ගමන් කර අංක 1197 වෙරළුගම ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන තෙක් ද එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර දෙසට කුලියාපිටිය. පන්නල මාර්ගය ඡේදනය කරමින් අංක 1189 තලහිටිමුල්ල ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන තෙක් ද, එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර හා වයඹ දෙසට ගමන් කර උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1508 වල්පිටගම ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක් ද එතැන් සිට එම මායිම ඔස්සේ නිරිත, ගිණිකොණ, නිරිත, වයඹ හා නිරිත දෙසට ගමන් කර අංක 1516 නවසිගහවත්ත ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර, දකුණ, නිරිත හා වයඹ දෙසට ගමන් කර අංක 1518 කුමාරඋඩවෙල ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර, දකුණ, වයඹ, ඊශාන හා උතුර දෙසට ගමන් කර අංක

උපලේඛනය I *(සම්බන්ධිතයි)*

*I තීරුව*

*II තීරුව*

1520 ඉලිප්පුගමුව ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ නිරිත දෙසට ගමන් කර එම වසමේ බටහිර මායිම හමුවන තෙක්ද (රට මැද මාර්ගය තෙක්ද)

*බටහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 1520 ඉලිප්පුගමුව ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 1519 කුඹුක්ගහමුල්ල ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර කුලියාපිටිය - කොළඹ මාර්ගය ඡේදනය කරමින් අංක 1513 පොල්ගහ අගාර ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම් ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 1511 කණුබිච්චිය ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 1486 දුම්මලසූරිය ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු, වයඹ නැවතත් උතුරු දෙසට ගමන් කර මාදම්පේ කුරුණෑගල මාර්ගය ඡේදනය කරමින් අංක 1487 බටහිර සියඹලාගස්රුප්ප ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 1485 රත්තැටියාව ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 1471 පහළ වීරකොඩියාන ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 1470 ඉහළ වීරකොඩියාන ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1469 බක්මීරුප්ප ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද (විලත්තව - මාදම්පේ මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ) එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 1468 වැල්ලරාව ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 1479 අලුත්ගම ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු හා ඊශාන දෙසට ගමන් කර අංක 1478 විලත්තව ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද (හලාවත - කුරුණෑගල මාර්ගය ඡේදනය කරමින්) එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 1459 බිංගිරිය ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ ඊශාන දෙසට ගමන් කර අංක 1458 ඌරාපොත්ත ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ ඊශාන දෙසට ගමන් කර අංක 1452 පහළ ගල්වැව ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර ආරම්භක ලක්ෂ්‍යය දක්වාද වූ මුළු මහත් ප්‍රදේශය.

EOG 12 - 0235

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.